සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# දෙවන වාර පරීක්ෂණය 2019

09 ශ්‍රේණිය

# පුරවැසි අධ්‍යාපනය

කාලය පැය 02 යි.

නම/ විභාග අංකයඃ

## I - කොටස

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා 2 x 20 = ලකුණු 40 ක් හිමිවේ.**
- **ප්‍රශ්න අංක 01- 05 දක්වා ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියා දක්වන්න.**

01. සමාජ සුරක්ෂිතතාවය ගොඩනගා ගැනීම සඳහා අවශ්‍ය පසුබිම පුළුල් ලෙස සංවිධානය කළ සංවිධිත ආයතනයක් ලෙස ............................................ හැඳින්විය හැක.

(පවුල / පාසල / සමාජ ආයතන)

02. තම කටයුතු පහසුකර ගැනීම සඳහා මිනිසා යොදාගන්නා ක්‍රමවේදය ........................................ ලෙස හැඳින්විය හැකිය.

(තාක්ෂණය / යන්ත්‍ර සූත්‍ර / උපකරණ)

03. රටක සංවර්ධන අවශ්‍යතා හඳුනාගෙන ඒවා ඉටුකර ගැනීම සඳහා සකස් කරන දිගුකාලීන වැඩපිළිවෙල ......................................................... ලෙස හඳුන්වයි.

(ජාතික ආර්ථිකය / ජාතික සංවර්ධනය / ජාතික ප්‍රතිපත්ති)

04. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකුට ඡන්ද බලය හිමිකර ගැනීම සඳහා වයස අවුරුදු .......................................... ක් සම්පූර්ණ කර තිබිය යුතුය.

(21 / 35 / 18)

05. ඈත අතීතයේ ළමුන් අධ්‍යාපනය ලබාගැනීමේ දී ලිවීම සඳහා ..................................... භාවිතා කළ අතර පසුකාලීනව එය වෙනස්විය.

(වැලිපිල්ල / ගල්ලෑල්ල / කළුලෑල්ල)

- **අංක 06 - 10 දක්වා ප්‍රශ්නවල දැක්වෙන ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද වරහන් තුළ යොදන්න.**

06 ''සාධාරණ හා නීතිගරුක සමාජයක් ගොඩනැගීම'' යන්න ශ්‍රී ලංකා පොලීසියේ ආදර්ශ පාඨයයි. (     )

07 නව තාක්ෂණික සොයාගැනීම් නිසා ශ්‍රම විභජනය හා විශේෂීකරණය වේගවත්වී ඇත. (     )

08 ඇතැන්ස් පෞර රාජ්‍යයේ පාලන කටයුතුවලට සහභාගී වීමට අවස්ථාව හිමිවූයේ කාන්තාවන්ට හා විදේශිකයන්ට පමණි. (     )

09 1987 අංක 15 දරණ පනත මගින් ප්‍රාදේශීය සභා පිහිටුවා ඇත. (     )

10 පළාත් පාලන ආයතනයක ප්‍රධානියා වන්නේ රාජ්‍ය නිලධාරියෙකි. ඔහු එහි කටයුතු මෙහෙයවයි. (     )

- අංක 11 - 15 දක්වා ප්‍රශ්නවලට ගැලපෙන නිවැරදි පිළිතුර හිස්තැන මත ලියා දක්වන්න.



A රූපය

11 A රූපයෙන් දැක්වෙන්නේ ශ්‍රී ලංකාවේ මුලින්ම ආරම්භ කළ මහනගර සභාව වන ....................................................... මහනගර සභාවයි.

12 ශ්‍රී ලංකාවේ වර්ථමානයේ ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන වර්ග 3 කි. ඉන් ඔබ ප්‍රදේශය අයත් පළාත් පාලන ආයතනය වන්නේ ................................................................... ය.

13 පළාත් පාලන ආයතනවලට නියෝජිතයන් තෝරාගනු ලබන්නේ ඡන්ද කොට්ඨාස මට්ටමින් කේවල නියෝජනය ක්‍රමය හා ................................................ නියෝජන ක්‍රමය යන ක්‍රම දෙකට අනුවය.

14 මහ නගර සභාවක ප්‍රධානියා වන්නේ ............................................................................................................ ය.

15 ප්‍රජාතන්ත්‍රවාදී රටක ජනතාවගේ යුතුකමක් වන්නේ ....................................................... නායකයන් පළාත් පාලන ආයතනවලට තෝරා ගැනීමයි.

- අංක 16 - 20 දක්වා ප්‍රශ්නවලට වඩාත් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

16 ඇමරිකා එක්සත් ජනපදයේ පැවති වහල් සමාජය ඉවත් කිරීමට කටයුතු කළ හිටපු ජනාධිපතිවරයකු වන්නේ,

(1) තෝමස් අල්වා එඩිසන් ය.
(2) චාල්ස් ඩිකන් ය.
(3) ඒබ්‍රහම් ලින්කන් ය.
(4) බරක් ඔබාමා ය.

17 ඔබේ පාසලේ පිහිටුවා ඇති පාසල් සමුපාකාර සමිතියෙන් ඉටුකරගත හැකි සේවාවන් වන්නේ,

(1) ණය පහසුකම් ලබාගැනීම.
(2) සාමාජික ඉතුරුම් පවත්වාගෙන යාම.
(3) පහසු මිලට පාරිභෝගික ද්‍රව්‍ය මිලදී ගැනීම.
(4) ක්‍රීඩා හෝ පාසල් උපකරණ පහසු මිලට ලබාගැනීම.

18 මැතිවරණයකදී ඡන්ද දායකයකු ඡන්දය පාවිච්චි කිරීමේ දී සැළකිලිමත් විය යුතු කරුණක් වන්නේ,

(1) පෞද්ගලික ලාභ අපේක්ෂාවෙන් තොරව කටයුතු කරන නායකයන් තෝරා ගැනීම.
(2) තම ප්‍රදේශයේ සංවර්ධනයට පමණක් අවංකව කැපවෙන පුද්ගලයෙකු තෝරාගැනීම.
(3) තම ප්‍රදේශයේ දේශපාලන ප්‍රභූවරයෙක් තෝරාගැනීම.
(4) ජනතා නියෝජිත පවුලකින් අවංක පුද්ගලයෙකු තෝරා ගැනිම.

19 පළාත් පාලන ආයතන වලින් ලබාදෙන සේවා සම්බන්ධයෙන් මහජනතාව විසින් ඉටුකළයුතු යුතුකම් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) වීථි රේඛා සහතික නිකුත් කිරීම.
(2) පරිසර සංරක්ෂණයට කටයුතු කිරීම.
(3) පොදු දේපල ආරක්ෂා කිරිම හා අරපිරිමැස්මෙන් යුතුව ප්‍රයෝජනයට ගැනීම.
(4) අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම.

20 පුරවැසියෙකු ලෙස ජාතිය ගොඩනැගීම සඳහා ඔබට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ගයක් වන්නේ,

(1) තම පෞද්ගලික ජීවිතය සාර්ථක කර ගැනීම.
(2) ලාභ අපේක්ෂාවෙන් කටයුතු කිරිම.
(3) දැරිය හැකි ජීවන රටාවක් පවත්වාගෙන යාම.
(4) තමාගෙන් සමාජයට ලැබිය යුතු දෙයට වඩා සමාජයෙන් තමාට ලැබිය යුතු දෙය පිළිබඳව සැලකිලිමත් වීම.

(ලකුණු 2 x 20 = 40)

## II - කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමු ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න 04 ක් තෝරාගෙන ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.

01 (1) සමාජ සුරක්ෂිතතාව සඳහා පාසලෙන් ඉටුකරන කාර්යයන් 2 ක් ලියන්න.

(2) ශ්‍රී ලංකාවේ වර්තමානයේ ක්‍රියාත්මක වන අධිකරණ ආයතන වර්ග 2 ක් ලියන්න.

(3) ආර්ථිකයක සිදුවන වෙනස්වීම් ප්‍රධාන අංශ තුනක් යටතේ සලකා බැලේ. ඉන් දෙකක් ලියන්න.

(4) ඔබ සතු සහජීවන ගුණාංග 2 ක් ලියන්න.

(5) ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රධාන ආකාර දෙකකි. එම ආකාර 2 ක ලියන්න.

(6) ශ්‍රී ලංකාවේ වර්තමානයේ ක්‍රියාත්මක වන මැතිවරණ වර්ග 2 ක් ලියන්න.

(7) ලෝකයේ නියෝජන / වක්‍ර ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වන රටවල් 2 ක් නම් කරන්න.

(8) පළාත් පාලන ආයතනවල ප්‍රධානීන් සතු බලතල 2 ක් ලියන්න. (ලකුණු 8 x 2 = 16)

02



B රූපය

(i) ඉහත B රූපයේ ඇත්තේ සමාජ සුරක්ෂිතතාවය සඳහා දායක වන ප්‍රධාන ආයතනයකට සම්බන්ධ පුද්ගලයන් ය. එම ආයතනය නම්කර එම ආයතනයට අයත් ප්‍රධාන අංශ තුන ලියන්න. (ල. 04)

(ii) ඉහත ඔබ හඳුනාගත් ආයතන පොදුවේ සමාජ සුරක්ෂිතතාව සඳහා ඉටුකරනු ලබන කාර්යයන් 3 ක් ලියන්න. (ල. 03)

(iii) (අ) ඉහත ආයතනවලට අමතරව සමාජ සුරක්ෂිතතාව සඳහා දායක වන ඔබ ප්‍රදේශයට අයත් ආයතන 2 ක් ලියන්න. (ල. 02)

(ආ) සමාජ සුරක්ෂිතතාවයට දායක වන ආරක්ෂක හමුදාව හා සම්බන්ධව පුද්ගල වගකීම් හා යුතුකම් 2 ක් ලියන්න. (ල. 02)

03



A



B



C

(i) ඉහත A, B, C රූපවල ඇත්තේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන සංස්කෘතීන්ට අයත් පින්තූර 03 කි. එම පින්තූර කුමන සංස්කෘතීන් ට අයත් දැයි නම් කරන්න.

(ii) තාක්ෂණික වෙනස්වීම් නිසා ඇතිවන හිතකර හා අහිතකර බලපෑම් කියවා නිවැරදි ලෙස වගුගත කරන්න.

1. මිනිස් අවශ්‍යතා සංකීර්ණ වීම.
2. මිනිසා අනවශ්‍ය පරිභෝජන රටාවකට හුරුවීම.
3. වැඩ පහසුවීම.
4. මානව සමාජ සබඳතා පුළුල් වීම.
5. සම්පත් නාස්තිය අවම වීම.
6. මිනිසුන් යාන්ත්‍රික වීම.
7. කාර්යක්ෂමතාවය වැඩිවීම.
8. පරිසර දූෂණය වේගවත්වීම.

| හිතකර බලපෑම් | අහිතකර බලපෑම් |
|---|---|
| 1. | 1. |
| 2. | 2. |
| 3. | 3. |
| 4. | 4. |

(ල. 08)

04 ''පරිසරය මා රකී, රකිමි මම පරිසරය
ලෝකයට බර නොවී වැඩ පිණිස මම හැදෙමි
වාසනාවන්ත වූ අනාගතයක් කරා
පාසලින් මග දකින හොඳම දරුවා මමයි.''

(i) ඉහත ගීතයට අනුව ඔබ තුළ වර්ධනය කරගතයුතු යහජීවන ගුණාංග 2 ක් ලියන්න. (ල. 02)



(ii) ඉහත රූපයෙන් දක්වා ඇත්තේ කුමන අවස්ථාවක් ද? එවැනි ගුණාංග ජීවිතයට අදාළ කර ගැනීමෙන් ඇතිවන යහපත් ප්‍රතිඵල 3 ක් ලියන්න. (ල. 04)

(iii) (අ) ලෝකයේ හෝ රටක ජීවත්වන ජනතාවකට හුදකලාව ජීවත් විය නොහැක. ඊට බලපාන හේතු 3 ක් ලියන්න. (ල. 03)

(ආ) අන්‍යෝන්‍ය රැඳියාවෙන් කටයුතු කිරීම සඳහා ලෝක මට්ටමෙන් පිහිටුවාගෙන ඇති සංවිධාන 2 ක් ලියන්න. (ල. 02)

05 (i) පහත දක්වෙන රූපයේ ඇති දේශපාලන පක්ෂ වර්ගීකරණය සම්බන්ධ හිස්තැන් පුරවන්න.

දේශපාලන පක්ෂ

| A .................................. | B .................................. | C .................................. |
|---|---|---|

(ල. 03)

(ii) පුරවැසියෙකු සතු අයිතිවාසිකම් හා යුතුකම් ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න.

1. පාලකයන් තෝරාගැනීම.
2. නීත්‍යානුකූල රැකියාවක යෙදීම.
3. නීතිරීතිවලට අවනතවීම.
4. රජය මගින් පනවන බදු මුදල් නියමිත පරිදි ගෙවීම.
5. තමන් කැමති දේශපාලන පක්ෂයකට ඡන්දය දීම.
6. රාජද්‍රෝහී නොවීම.
7. අධ්‍යාපනය ලැබීම.
8. ජාතික සමගිය පෝෂණය කිරීම.

| පුරවැසියකු සතු අයිතිවාසිකම් | | පුරවැසි යුතුකම් | |
|---|---|---|---|
| 1 | | 1 | |
| 2 | | 2 | |
| 3 | | 3 | |
| 4 | | 4 | |

(ල. 08)

06 (i) පහත පින්තූර වලින් දැක්වෙන්නේ පළාත් පාලන ආයතන වලින් ඉටුකරන සේවා 3 කි. ඒවා නම් කරන්න. (ල. 03)


A


B



C


(ii) ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන මූල්‍ය සම්පත් උපයා ගන්නා ආකාරය උදාහරණ දෙකක් සහිතව ලියන්න. (ල. 02)

(iii) තම ප්‍රදේශයට අයත් පළාත් පාලන ආයතන විසින් පහත වගකීම් ඉටුකිරීම සඳහා කරනු ලබන කාර්යයන් 2 බැගින් වගුවට ඇතුළත් කරන්න.

| ජල සම්පාදනය | කසල බැහැර කිරීම | ඩෙංගු මර්දනය |
|---|---|---|
| | | |

(ල. 06)

07 පහත දැක්වෙන උපකාරක පද උපයෝගී කරගෙන ප්‍රහේළිකාව සම්පූර්ණ කරන්න.




හරහට

1. සහයෝගයෙන් ජීවත්වීම යන තේරුම ගනී.
2. පුද්ගලයෙකු සමාජයට හැඩගැස්වීමේ මූලික පුහුණුව ලබාදෙන්නේ මෙම ඒකකයෙනි.
3. යහපත්ව ජීවත්වීම යන අර්ථය ගනී.
4. ගුණගරුක පුද්ගලයෙකු බිහිකිරීම සඳහා බෞද්ධ ආගමිකයන්ට උපකාරී වන ආයතනයකි.
5. සමුපාකාර සේවාවෙන් ඉටුකරන කාර්යයකි.
6. ජපානයේ කාන්තාවන් අඳින සාම්ප්‍රදායික ඇඳුමකි.
7. ස්ථිරසාර යන්නට සමාන පදයකි.

පහළට

8. මෙම ව්‍යාපාරයේ පියා වන්නේ බ්‍රිතාන්‍ය ජාතික රොබට් ඕවන් ය.
9. හොඳ යන්නට සමාන පදයකි.
10. සෑම පුද්ගලයෙකුටම බියෙන් හා සැකයෙන් තොරව ජීවත් වීමට සමාජයෙන් ලැබෙන රැකවරණය හා ආරක්ෂාව යන අර්ථය ගනී.
11. ජනතාවගේ මුදල් අවශ්‍යතා ඉටුකරන තවත් සමුපාකාර සමිති වර්ගයකි. (ල. 11)

## I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. | පාසල | 02. | තාක්‍ෂණය | 03. | ජාතික ප්‍රතිපත්ති | 04. | අවුරුදු 18 | 05. | වැලිපිල්ල |
| 06. | × | 07. | ✓ | 08. | × | 09. | ✓ | 10. | × |
| 11. | කොළඹ | 12. | පිළිතුර අනුව | 13. | සමානුපාතික | 14. | පුරපති/නගරාධිපති | 15. | අවංක/උගත්/බුද්ධිමත්/ආදර්ශවත් |
| 16. | 3 | 17. | 4 | 18. | 1 | 19. | 3 | 20. | 3 |

(2 x 20 = 40)

## II කොටස

01. (1) විධිමත් අධ්‍යාපනයක් ලබාදීම. / යහපත් සමාජශීලී විනයගරුක පුද්ගලයන් බිහිකිරීම / සමබර පෞරුෂකින් යුතු පුද්ගලයන් බිහිකිරීම (පිටුව 06)

(2) ශ්‍රේෂ්ඨාධිකරණය / අභියාචනාධිකරණය / පළාත්බද මහාධිකරණය / මහාධිකරණය / දිසා හා මහේස්ත්‍රාත් අධිකරණය

(3) කාර්මික / කෘෂිකාර්මික / සේවා

(4) සහයෝගයෙන් කටයුතු කිරීම / බෙදාහදා ගැනීම / අන්‍යයන්ට ගරු කිරීම / අවංක බව (පිටුව 51)

(5) සෘජු ප්‍රජාතන්ත්‍රවාදය / වක්‍ර ප්‍රජාතන්ත්‍රවාදය

(6) ජනාධිපතිවරණය / මහා මැතිවරණය / පළාත් සභා මැතිවරණය / පළාත් පාලන මැතිවරණය

(7) පිළිතුර අනුව

(8) සභාව කැඳවීම හා කල් තැබීම / සභාවේ මුලසුන දැරීම / මහජන උපයෝගිතා සේවා සැපයීම / පළාත් පාලන ආයතන කටයුතු සංවිධානය (ල. 8 x 2 = 16)

02 (i) ආරක්‍ෂක හමුදා (යුධ හමුදාව, නාවික හමුදාව, ගුවන් හමුදාව) (ල. 04)

(ii) යුධමය තත්ත්වයෙන් රට ආරක්ෂා කිරීම / කැරලි කෝලාහල හා ත්‍රස්තවාදී ක්‍රියා මර්දනය / ශ්‍රී ලංකාව තුළ භෞතික හා මානව සම්පත් ආරක්ෂා කිරීමට සහාය වීම / හදිසි ආපදා විපත් අවස්ථාවලදී සහන සැලසීම / වැඩවර්ජන වැනි අවස්ථාවල අත්‍යාවශ්‍ය සේවා පවත්වාගෙන යාම..... (පිටුව 18) (ල. 03)

(iii) (අ) ළමා සමිති, ක්‍රීඩා සමිති, ගොවිසමිති, වැඩිහිටි සමිති, මරණාධාර සමිති ... ආදී වශයෙන් ඕනෑම ආයතන 2 ක් (ල. 02)

(ආ) ආපදා සහන සේවා සඳහා සහාය ලබාදීම / කැරලි අවස්ථාවලදී ආරක්ෂක හමුදාව දැනුවත් කිරීම / සාමය පවත්වාගෙන යාමට ආරක්ෂක හමුදාවලට සහාය වීම / ආරක්ෂක හමුදා සේවය ඇගයීම / රණවිරු සුභසාධනයට හැකි පමණ දායක වීම (ල. 02)

03 (i) A සිංහල සංස්කෘතිය B දෙමළ සංස්කෘතිය C මුස්ලිම් සංස්කෘතිය (ල. 03)

(ii)

| හිතකර | අහිතකර |
|---|---|
| * වැඩ පහසුවීම | * මිනිස් අවශ්‍යතා සංකීර්ණ වීම |
| * මානව සමාජ සබඳතා පුළුල් වීම | * මිනිසා අනවශ්‍ය පරිභෝජන රටාවකට හුරුවීම |
| * සම්පත් නාස්තිය අවම වීම | * මිනිසුන් යාන්ත්‍රික වීම |
| * කාර්යක්‍ෂමතාවය වැඩිවීම | * පරිසර දූෂණය වේගවත් වීම (ල. 08) |

04 (i) පරිසරය සුරැකීම / යහපත් දරුවකු වීම / අවංකව වැඩ කිරීම (ල. 02)

(ii) සාමූහිකව කටයුතු කරන අවස්ථාවක් / පුද්ගල සංවර්ධනය සිදුවීම / සාමය ස්ථාපිත වීම / සුහදතාව ගොඩනැගීම / සමාජ සංවර්ධනය වේගවත් වීම / ගැටුම් අවම වීම (ල. 04)

(iii)

| (අ) | (ආ) |
|---|---|
| * සම්පත් විසංතුලනය | * එක්සත් ජාතීන්ගේ සංවිධානය |
| * ගෝලීය විවිධත්වය | * සාර්ක් සංවිධානය |
| * තම රටට අවශ්‍ය දෑ තමන්ටම නිපදවා ගත නොහැකි වීම | * ආසියානු සංවිධානය |
| * විශ්ව ගම්මානයක් බවට ලෝකය පත්වීම | |
| * තොරතුරු තාක්‍ෂණය දියුණු වීම (ල. 03) | * යුරෝපා හවුල (ල. 02) |

## පිළිතුරු ඉතිරි කොටස

05 (i) A ඒක පක්ෂ B ද්වි පක්ෂ C බහු පක්ෂ (ල. 03)

(ii)

| <u>අයිතිවාසිකම්</u> | <u>යුතුකම්</u> |
|---|---|
| * පාලකයන් තෝරාගැනීම | * නීතිරීතිවලට අවනත වීම |
| * නීත්‍යානුකූල රැකියාවක යෙදීම | * රජය මගින් පනවන බදු මුදල් නියමිත පරිදි ගෙවීම |
| * තමන් කැමති දේශපාලන පක්ෂයකට ඡන්දය දීම | * රාජද්‍රෝහී නොවීම |
| * අධ්‍යාපනය ලැබීම | * ජාතික සමගිය පෝෂණය කිරීම (ල. 08) |

06 (i) A පොදු ලිං පවත්වාගෙන යාම

B ගිනි නිවීමේ සේවය

C ප්‍රතිචක්‍රීකරණය සඳහා කසළ එක්රැස් කිරිම. (ල. 03)

(ii) වරිපනම් / බදු මුදල් , පළාත් පාලන ඇමතිවරයා වෙන්කරන මුදල් , පළාත් පාලන ආයතන දේපල බදුදීම, පොදු සේවා සැපයීමෙන් ලබන ආදායම් (පිටුව 99) (ල. 03)

(iii) <u>ජල සම්පාදනය</u>

* පානීය ජල හිඟයක් පවතින ප්‍රදේශවලට ජලය සැපයීම සඳහා ජල මූලාශ්‍ර හඳුනාගැනීම.
* නළ ලිං ස්ථාපිත කිරීම.
* ජල හිඟ ප්‍රදේශවලට බවුසර් මගින් ජලය සැපයීම.

<u>කසල බැහැර කිරීම</u>

* කසල වර්ග කර බැහැර කිරීමට කටයුතු කිරීම
* කසළ බඳුන් සැපයිම
* කසළ එක්රැස් කිරීම
* ප්‍රතිචක්‍රීකරණය සැළසුම් කිරීම
* කාබනික පොහොර නිෂ්පාදනය

<u>ඩෙංගු මර්දන වැඩසටහන්</u>

* ඩෙංගු බෝවන අවදානම් ස්ථාන හඳුනාගැනීම
* එම ස්ථාන පවිත්‍ර කිරීම
* මදුරු වාහකයන් විනාශ කිරීම
* ඒ සඳහා සැමගේ සහාය ලබාගැනීම (ල. 06)

07 <u>හරහට</u>

1. සහජීවනය 2. පවුල 3. යහජීවනය 4. පන්සල 5. රක්ෂණ
6. කිමෝනාව 7. තිරසර

<u>පහළට</u>

8. සමුපකාරය 9. යහපත් 10. සමාජ සුරක්ෂිතතාව 11. ණය දෙන සමිති (ල. 11)